13167

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - I

කාලය : පැය 01 යි.

නම/විභාග අංකය :- ....................................................................................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ලකුණු 40යි
- පහත සඳහන් ඡායාරූපය උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් පිළිතුරු සපයන්න.



01. මෙම චිත්‍රයේ නිර්මාණ ශිල්පියා වනුයේ ........................................................................ය.
02. මෙම චිත්‍රය හඳුන්වන්නේ ...................................................................... යන නමිනි.
03. මෙම සිතුවම ලී පුවරුවක් මත ............................................................ මාධ්‍යයෙන් සිත තර ඇත.
04. මෙම සිතුවමෙන් පිටිසර ගැමි පරිසරයක් සහිත භූමි දර්ශණයක් ද ............................................ ලක්ෂණ ද, මරිය තුමිය සාමාන්‍ය ගැහැණියක් ලෙස ද දක්වා ඇත.
05. මෙය දැනට දක්නට ඇත්තේ ........................................ නුවර කලා කෞතුකාගාරයක් තුළය.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. ගම්පොළ යුගයට අයත් සද්ධර්මතිලක විහාරය හෙවත් ගඩලාදෙණිය විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා කවරෙක් ද?

    ..............................................................................................................

07. විචාරක මතය අනුව පාරා වරුන්ගේ ආරක්ෂාව හා තෙදබල පරාක්‍රමය දක්වන මූර්ති විශේෂය කුමක් ද?

    ..............................................................................................................

08. ශිවගේ නටරාජ මූර්තියේ අතෙහි ඇති ගිනි සිළුව මගින් නිරූපනය කෙරෙනුයේ කුමක් ද? ..................................
09. ලිඛිත ඓතිහාසික සාක්ෂි අනුව ලංකාවේ ඉදි වූ මුල්ම වටදාගෙය කුමක් ද? ..................................
10. 'පර්වත මස්තකයේ දේව මැහියෝ' සිතුවම නිර්මාණය කර ඇති ශිල්පියා කවුරුන් ද? ..................................

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

11. පිත්තල නිෂ්පාදිත ලෝහ වර්ගයක් වන අතර පිත්තල පකප්පර ගැනීම සඳහා මිශ්‍ර කරනු ලබන ලෝහ වර්ග දෙක වනුයේ
    (i) තඹ සහ ඇළුමිනියම් ය.　(ii) තඹ සහ තුත්තනාගම් ය.
    (iii) තඹ සහ ඊයම් ය.　(iv) තඹ සහ ටින් ය.

12. ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාට අනුව සඳකඩ පහණේ ඇති 'සත්වාවලිය' තීරුව මඟින් නිරූපනය වනුයේ යයි ප්‍රකාශ කරන මතය වනුයේ,

(i) සසර දුකින් මිදීම වේ. (ii) තෘෂ්ණාව, ආශාව, රාග ගින්න වේ.
(iii) විමුක්තිය ලබා ගැනීම වේ. (iv) ජාති, ජරා, ව්‍යාධි, මරණ වේ.

13. පොළොන්නරුව හින්දු කෝවිල් ආශ්‍රිතව හමුවූ හින්දු ලෝකඩ මූර්තියක් වූ ගණදෙවි රුව නම් වූ ලෝකඩ මූර්තිය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වනුයේ,

(i) ත්‍රිභංග නැවුමෙන් මෙම මූර්තිය නිර්මාණය කර ඇති බව.
(ii) මහා රාජ විලාසයෙන් ඉඳගෙන සිටින බව.
(iii) ඉදිරිපස දකුණු අතින් බිඳුණු දලයක් සහ ඉදිරි වමතින් අඹ ගෙඩියක් දරා සිටින බව.
(v) ගණ දෙවියන් ශිව හා පාර්වතී ගේ වැඩිමහල් පුත්‍රයා ලෙස සැලකෙන බව.

14. ගම්පොල යුගයේ ඉදිවූ ඇම්බැක්ක දේවාලය නිර්මාණය කරන ලද්දේ

(i) තොප්පවත්තේ සිත්තර නයිදේ විසිනි. (ii) දේවේන්ද්‍ර මූලාචාරී විසිනි.
(iii) දෙල්මඩ මූලාචාරි විසිනි. (iv) දෙවරගම්පල සිල්වත් තැන විසිනි.

15. නව රාජධානි යුගයකට අයත් 'තුරඟුන් දඩයම' චිත්‍රය හා සම්බන්ධ වනුයේ පහත සඳහන් කුමන නමක්ද?

(i) නෙබාමුන් (ii) ඇල්ටමිරා (iii) ලැස්කෝ (iv) කෝගුල්

- **අංක 16 සිට 20 තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට සෘජු සබඳතාවයක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති A, B, C, D, E යන රූප සටහන් අතුරින් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

16.  (................)  A

17.  (................)  B

18.  (................)  C

19.  (................)  D

20.  (................)  E

● **ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

21. ගල් කණු මත ඉදිකරන ලද විහාර විශේෂය හඳුන්වනු ලබන්නේ ........................................................ විහාර යනුවෙනි.

22. මහනුවර ශ්‍රී දළදා මාලිගාවට අයත් ගොඩනැගිලි අතර ඇති පත්තිරිප්පුවෙහි නිර්මාණ ශිල්පියා ලෙස කටයුතු කර ඇත්තේ ........................................................ නම් අයයි.

23. ඇම්බැක්ක දේවාලයේ පරාල 26ක් එක් ලී ඇණයකට සම්බන්ධ කර ඇති ශාක නිර්මාණමය අංගය ........................................ ලෙස හඳුන්වනු ලබයි.

24. ලංකාතිලක විහාරය ඉදිකිරීමේ දී එහි නිර්මාණ ශිල්පියා ලෙස කටයුතු කර ඇත්තේ ස්ථපතිරායර් නම් අයෙකු වන අතර මෙම ඉදිකිරීම සඳහා මූලික වී උපදෙස් ලබා දෙන ලද්දේ ........................................ නම් අමාත්‍ය වරයා විසිනි.

25. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අනුරාධපුර මාර්ගයේ ශ්‍රී ලංකාවේ දැනට ශේෂ වී ඇති අංග සම්පූර්ණ දැවමය අම්බලම පිහිටා ඇති අතර එය ........................................................ අම්බලම නම් වේ.

● **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



F



G



H



I



J

26. ඉහත F ඇසුරින් දැක්වෙන බුද්ධ ප්‍රතිමාව දක්නට ඇත්තේ කොහිද? ........................................................

27. ඉහත G අකුරින් දැක්වෙන නෙෆර්ටිටි රැජිනගේ ශීර්ෂ මූර්තිය දැනට ........................................ කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

28. H අකුරින් දැක්වෙන සිතුවම නිර්මාණය කර ඇත්තේ ........................................ ශිල්ප ක්‍රමය යටතේය.

29. I අකුරින් දැක්වෙන චිත්‍රය ලියනාඩෝ ඩාවින්චි ශිල්පියාගේ වන අතර එය දක්නට ඇත්තේ ........................................ නමැති තාපසාරාමයේ භෝජනාගාර බිත්තියකය.

30. J අක්ෂරයෙන් දැක්වෙනුයේ ලොව විශාලතම ෆ්‍රෙස්කෝ සිතුවම වන අතර එහි නිර්මාණ ශිල්පියා කවරෙක් ද? ........................................................

- ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය මඟින් ලියන්න.

31. ෆ්‍රෙස්කෝ බුවනෝ ..............................

32. සාරතා පෙත්ත ..............................

33. අලිලියාදු ..............................

34. පත්නිදර්ශන චිත්‍ර ..............................

35. හයිරොග්ලිෆික්ස් ..............................

- ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් පහත ඡායාරූපය උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න. මෙහිදී මෙම කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි දී ඇති උප මාතෘකාවලට අදාලව අර්ථවත් වාක්‍ය 05ක් ලියන්න. (පිළිතුර සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අනිවාර්ය වන අතර තනි වචනයෙන් පිළිතුරු ලිවීම සඳහා ලකුණු පිරිනැමීමු නොලැබේ.)



36. හඳුනාගත් බව:- ..............................

37. දක්නට ඇති ස්ථානය:- ..............................

38. යුගය:- ..............................

39. නිමවා ඇති මාධ්‍යය:- ..............................

40. භාව ප්‍රකාශය:- ..............................

13187

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - II

කාලය : පැය 02 යි.
ලකුණු 30යි

නම/විභාග අංකය :- ..........................................................

**නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

- ඔබ ඉදිරියේ ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.
  1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
  2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

- මෙම චිත්‍ර දෙකම එකට අමුණා නම/විභාග අංකය සහ පන්තිය සඳහන් කොට ශාලාධිපතිට/චිත්‍ර ගුරුවරයාට භාර දෙන්න.

- ඔබගේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත්ව ලකුණු පිරිනැමේ.

රේඛා අධ්‍යයනය

1. රේඛා මගින් කරන ලද පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතාව — ලකුණු 05යි

වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම — ලකුණු 05
3. පරිමාණ, පර්යාවලෝක රීති සහ ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය — ලකුණු 05
4. ඇඳන ලද ද්‍රව්‍ය වල ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම — ලකුණු 05
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා — ලකුණු 05
6. උචිත පසුබිමක් යෙදීම සහ සමස්ත නිමාව — ලකුණු 05

මුළු ලකුණු 30

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - II

**(ගුරුවරුන් සඳහා පමණයි)**

---

චිත්‍ර ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ සත්‍යාකාරව ආලෝක සකස් කළ යුතුයි.

**සපයාගත යුතු ද්‍රව්‍ය**

01. වර්ණවත් මල් සහිත චීත්ත රෙදි කැබැල්ලක්
02. සුදු කඩදාසියකින් ආවරණය කරන ලද කාඩ්බෝඩ් පෙට්ටියක්
03. බෝලයක් (මධ්‍යම ප්‍රමාණය)
04. ඇන්තූරියම් මල් සහිත පැලයක් සිටවූ මල් පෝච්චියක් (ප්ලාස්ටික්)

ඇන්තූරියම් කොළ 03ක් පමණ



සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

13183

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## චිත්‍ර කලාව - III

කාලය : පැය 02 යි.
ලකුණු 30යි

නම/විභාග අංකය :- ..................................................................................

පහත අ, ආ හෝ ඇ යන කොටස් 03න් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක් චිත්‍රයක් අඳින්න.

### 'අ' කොටස ප්‍රකාශන චිත්‍ර

01. මාළු ඇල්ලීමට ගිය ධීවර පිරිසක් විශාල මත්ස්‍ය ප්‍රමාණයක් හසුවීම නිසා සතුටින් ප්‍රබෝධවත්ව වෙරළට එන අවස්ථාව චිත්‍රයේ නිරූපණය කරන්න.
02. පාසලේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ ජයග්‍රාහී නිවාසය වෙත ජය කුසලාන ප්‍රදානය කරන අවස්ථාව චිත්‍රයට නගන්න.
03. ඉරිදා දිනයක මුහුදු වෙරළේ හෝ පාර්ශ්වෝද්‍යානයේ සතුටින් සිටින ළමුන් පිරිසක් චිත්‍රයට නගන්න.
04. වනයක නිදහසේ සැරිසරන රංචු ගැසුණු වන සතුන් සමූහයක් අඳින්න.

### 'ආ' මෝස්තර චිත්‍ර

05. කුෂන් කවරයක් සඳහා (සමචතුරස්‍රාකාර) සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
06. සාම්ප්‍රදායික මෝස්තර යොදාගෙන "පිත්තල බන්දේසියක් සඳහා සුදුසු මෝස්තරයක්" නිර්මාණය කරන්න.
07. මල් හා කොළ ආශ්‍රිතව නිර්මාණය කරන ලද ව්‍යාප්ති මෝස්තරයක් "චිත්ත රෙද්දක් සඳහා" නිර්මාණය කරන්න.
08. ඔසරි පල්ලුවක් සඳහා උචිත මෝස්තරයක් නිර්මාණය කරන්න.

### 'ඇ' ග්‍රැෆික් චිත්‍ර

09. ඩෙංගු උවදුර මැඩලීම ඉලක්ක කර නිර්මාණය කරන පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. තරුණ ජවයෙන් රට ගොඩනගමු. තේමාව අනුව පබැඳුණු කවි පන්තියක් සඳහා සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
11. ගෙවත්තේ පලතුරු පැළ සිටුවීම දිරිමත් කිරීම වෙනුවෙන් පළ කරන ලද පොතක් සඳහා පොත් පිටකවරයක් නිර්මාණය කරන්න.
12. වෙළඳ පොළට අලුතින් හඳුන්වා දෙනු ලැබූ, කාබනික පොහොර උපයෝගී කරගෙන වගා කරන ලද පලතුරු බීම බෝතලයක් සඳහා ලේබලයක් නිර්මාණය කරන්න.